# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාල ගොඩනැගිලි සැලසුම්කරණය:
## පේරාදෙණිය, කැලණිය සහ කොළඹ විශ්වවිද්‍යාල පුස්තකාල ගොඩනැගිලි ඇසුරින්

ජී.ඩබ්.ජී. ප්‍රියංවදා ලක්මාලි පතිගපුරිය
පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

මිනිස් ස්මෘතිය ඉක්මවා ගොස් එම දැනුම යම් තැනක ලියා තැබීමට ගත් උත්සාහය නිසා පොත නැමති ආකෘතිය බිහිවූ අතර එබඳු පොත් රැස්කිරීම සහ සංරක්ෂණය සඳහා තැන්පත් කළ ස්ථානය පුස්තකාලය විය. පුස්තකාලය යන වචනය Libraria යන ලතින් වචනයෙන් බිඳී ආවක් වන අතර එහි අදහස දැනුම ගබඩා කළ ගොඩනැගිල්ල යන්නයි. ඒ අනුව පුස්තකාලය සහ ගොඩනැගිලි සංකල්පය අතීතයේ සිට අත්‍යන්තව බැඳී තිබූ බව පැහැදිලිය. මුල් කාලයේ පුස්තකාලය ඉතා ප්‍රාථමික මට්ටමේ ද්‍රව්‍ය ගබඩා කළ ගබඩාවක හෝ සංරක්ෂණාගාරයක අර්ථයෙන් විග්‍රහ කළද අද වන විට පුස්තකාලය යනු තොරතුරු මූලාශ්‍ර රැස් කරන,සංවිධානය කරන, සංරක්ෂණය කරන සහ බෙදාහරින ප්‍රජාතන්ත්‍රීය ආයතනයක් බවට පත්වී ඇත.එසේ සේවා සපයන ආයතනයකට ගැලපෙන ලෙස පුස්තකාල ගොඩනැගිල්ල නිර්මාණය වීමද අත්‍යාවශ්‍ය කරුණක් වී ඇත. ඉදිකිරීම ක්‍රමවේද වල සිදුවී ඇති වෙනස්කම, පුස්තකාල ද්‍රව්‍ය වල ස්වභාවයේ විවිධතාව, පාඨක වර්ධනය සහ ඔවුන් ගේ තොරතුරු අවශ්‍යතා විවිධ වීම, පුස්තකාල සේවාවන්ගේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක වර්ධනය, පුස්තකාල සේවකයන් ගේ වෘත්තීය කටයුතුවල විවිධතාව ආදී කරුණු නිසා පුස්තකාල ගොඩනැගිලි සැලසුම්කරණය අද වනවිට භාරදූර කටයුත්තක් වී ඇත. පාඨකයන්ට සහ පුස්තකාල සේවකයන්ට සෑම අතින්ම උචිත හා තම කටයුතු පහසුවෙන් කරගැනීමට හැකිවන පරිදි පුස්තකාල ගොඩනැගිලි සැලසුම්කරණය කරන්නේ කෙසේද යන්න පිළිබඳව පුස්තකාලාධිපතිවරුන්ගේ අවධානය පෙරට වඩා යොමුවී ඇත.

මෙම පර්යේෂණයේදී ප්‍රධාන වශයෙන් ලංකාවේ පුග නූතන නිර්මාණය කරන ලද පේරාදෙණිය (1960), කැලණිය (1977) සහ කොළඹ (1999) යන විශ්වවිද්‍යාල පුස්තකාල ගොඩනැගිලි ඇසුරින් තුලනාත්මක අධ්‍යයනයක් සිදු කරන ලදී. පුස්තකාල ගොඩනැගිලි සැලසුම්කරණයේදී වැදගත් වන ඉඩ සැලසුම (Space planning) ගෘහ භාණ්ඩ සහ උපකරණ සැලසුම් (Furniture planning) ආලෝකකරණය (Lighting) ශබ්ද පාලනය (Noise controlling) වාතාශ්‍ර පාලනය (Ventilating systems) සහ ආරක්ෂක පිළියම් (Security systems)යන කරුණු හය ඔස්සේ තොරතුරු ගවේෂණය සිදුවිය. එහිදී දත්ත රැස්කිරීම සඳහා පාඨකයන්ට සහ පුස්තකාල සේවකයන්ට ප්‍රශ්නාවලි ඉදිරිපත් කිරීම, ප්‍රධාන පුස්තකාලයාධිපතිවරුන්, තෝරාගත් සහකාර පුස්තකාලයාධිපතිවරුන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සහ ක්ෂේත්‍ර නිරීක්ෂණ භාවිත කරන ලදී. මෙහි දත්ත විශ්ලේෂණය මගින් අනාවරණය වූ ප්‍රධාන කරුණ නම් ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාල ගොඩනැගිලි මනාව සැලසුම් වී නැති බවයි. එසේම යම්තාක් දුරකට ප්‍රමිති ගත ලෙස සැලසුම් වූ ගොඩනැගිලි පවා පාඨක, සේවක අවශ්‍යතාවන්ට හා නූතන තාක්ෂණික මෙවලම් භාවිත කිරීමට ගැලපෙන පරිදි සංවිධානය වී නැති බවත් ක්‍රමවත් නඩත්තුවක් නොමැති වීමත් සහ නවීකරණයන් ප්‍රමාද වීමත් මෙන්ම ඇතැම්විට කොහෙත්ම නවීකරණය නොකිරීමත් දුර්වලතා ලෙස අනාවරණය විය.

පුස්තකාල ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ කළ මෙම පර්යේෂණයේදී පුස්තකාල ගොඩනැගිලිවල මනා සැලසුම්කරණය අත්‍යවශ්‍යම සාධකයක් බව පෙනීගිය කරුණකි. මෙම අධ්‍යයනය මගින් අනාගතයේ විශ්වවිද්‍යාල පුස්තකාල ගොඩනැගිලි පමණක් නොව පොදු වෙනත් වර්ග වල පුස්තකාල ගොඩනැගිලි අළුතින් නිර්මාණයට නියමුවක් සැපයීමත් දැනට පවත්නා ගොඩනැගිලි සංවිධානයේ දුර්වලතා සහ ගැටලු හඳුනාගෙන ඒවා අවම කර ගන්නට යෝජනා ඉදිරිපත් කිරීමත් සිදුවී ඇත. එනිසා පුස්තකාල ගොඩනැගිලි ප්‍රතිසංස්කරණයටද මෙම අධ්‍යයනය පිටිවහලක් වනු ඇත.